*සැ.යු.*: 2026.08.28 දින පළ වූ 2504 *ගැසට්* පත්‍රයේ IV(අ) වැනි කොටස පළ නොවේ ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,505 - 2026 සැප්තැම්බර් මස 04 සිකුරාදා - 2026.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 සැප්තැම්බර් මස 25 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 සැප්තැම්බර් මස 11 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82827 - (2026/09)
E - 01

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඪ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## හෝමියෝපති වෛද්‍ය සභාව

### හෝමියෝපති වෛද්‍ය සභාවේ හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම

හෝමියෝපති වෛද්‍ය සභාව මගින් ආරම්භ කරනු ලබන රජයේ හෝමියෝපති නව වෛද්‍ය සායන සඳහා හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමට පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර** :- හෝමියෝපති වෛද්‍ය නිලධාරී

**02. පත්වීමේ ස්වභාවය** :- ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**03. වැටුප් ක්‍රමය** :- සේවා ගණයට අදාල කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
MM 1-1-2016 : රු: (53,175-10×1,375-15×1,910-95,575/-)

**04. අවශ්‍ය සුදුසුකම්** :- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් වසර පහ හමාරකට නොඅඩු උපාධි පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ලබාගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් වසර හතරකට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හා ඉන් පසුව වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

අවම වශයෙන් වසරක සීමාවාසික පුහුණුවක් ලබාතිබීම, හෝමියෝපති වෛද්‍යවරයෙකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

අවම වශයෙන් එක් වසරක දේශීය හෝ විදේශීය රෝහලක, ආයතනයක හෝ සායනයක වෘත්තිමය (වෛද්‍ය චිකිත්සා අංශයෙන්) පළපුරුද්දක් ලබා තිබීම. (ප්‍රතිකාර කළ රෝගීන්ගේ නාම ලේඛණය සහ එම ආයතනයේ සේවය කළ බවට අදාළ ආයතනයේ නිල මුද්‍රාව සහිත ආයතන ප්‍රධානීන්ගෙන් හෝ පෞද්ගලිකව පවත්වාගෙන ගිය ආයතනයක් නම් අදාළ ආයතනය පවත්වාගෙන යනු ලැබූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය මගින් සනාථ කළ යුතු ය.)

**05. වයස් සීමාව** :- අවු. 25 ට නොඅඩු විය යුතු අතර අවු. 50 ට නොවැඩි විය යුතු ය.

**06. වෙනත්** :- සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**07. බඳවා ගැනීමේ ක්‍රමවේදය** :- පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම් වූ කුසලතා අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

**08. සුදුසුකම් ලබන දිනය** :- සේවයට/තනතුරට පත්කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙස පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 4,5 හා 6 යන වගන්ති වන සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

**09. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය** :- අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සෑම ආකාරයකින්ම සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර 4 හා 5 යන වගන්තිවලින් දැක්වෙන සුදුසුකම් සනාථ කිරීම සඳහා නිසිපරිදි සහතික කරනු ලද අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පත්වීම් බලධාරියා වනුයේ හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර එහි තීරණය අවසාන තීරණය වේ.

ඔබ විසින් සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක්,

**වෛද්‍ය ටී.එම්.එන්.පී.තෙන්නකෝන්,**
ලේඛකාධිකාරී(*වැ.බ.*)

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

යන ලිපිනයට 2026 සැප්තැම්බර් මස 18 දිනට පෙර යොමු කළ යුතු ය.

09 - 45

**පරිසර අමාත්‍යාංශය**

වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුරේ පුරප්පාඩු පිරවීම- 2026

වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුරු 11 ක් පිරවීම සඳහා වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත සුදුසුකම් සපුරා ඇති නිළධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

**(I) අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

**(II) පළපුරුද්ද :**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක තනතුරේ වසර 10 ක ස්ථිර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(III) කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

**(IV) වෙනත් :**

(අ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ආ) පූර්වාසන්න වසර පහ තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඇ) තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(V)** වයස: අදාළ නොවේ.

**03. වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, මාසික වැටුප් පරිමාණය : රු. 40,000/- 10x450- 10x490- 10x540- 12x590- 61,880/= (PL 1 – 2025) වේ.

**04. සේවයේ නියුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :**

(අ) ක්ෂේත්‍ර සහයක (අධීක්ෂණ) තනතුරට පත්වන නිලධාරීන්ගේ තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)

(ආ) එක් වර්ෂයක වැඩ බැලීමේ කාලයකට යටත් විය යුතු ය.

(ඇ) තනතුරට පත්කිරීමෙන් පසු වසර තුනක් (03)ක් ඇතුළත පළමුවන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

**05. තනතුරු සඳහා තෝරාගනු ලබන ක්‍රමය :-**

මෙම තනතුර සඳහා අයදුම්කරන නිළධාරින් අතුරින් වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක තනතුරේ ස්ථිර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා නිළධාරින් පත් කරනු ලැබේ. ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුර සඳහා පත්වීමට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 55 ක් ලබා ගත යුතු ය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ :

<table>
<tr><th>අනු. අංකය</th><th>පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>01</td><td>සේවා පළපුරුද්ද</td><td>40</td><td rowspan="7">55</td></tr>
<tr><td>02</td><td><u>පළපුරුද්ද</u><br>වෙරළ සංරක්ෂණ වැඩබිම්වල ඇති පළපුරුද්ද (ගල්වැටි දැමීම හා නඩත්තුව වාචික පරීක්ෂණයක් අනුව ලකුණු ලබාදීම)</td><td>15</td></tr>
<tr><td>03</td><td>යන්ත්‍ර උපකරණ හා බර වාහන පිළිබඳ ඇති දැනුම</td><td>10</td></tr>
<tr><td>04</td><td>යන්ත්‍ර උපකරණ නඩත්තුව හා ක්‍රියාකරවීම පිළිබඳ දැනුම</td><td>10</td></tr>
<tr><td>05</td><td>වෙරළ සංරක්ෂණ කටයුතුවලදී වගකීම් දරා තිබීම සඳහා</td><td>20</td></tr>
<tr><td>06</td><td>පෞරුෂත්වය</td><td>05</td></tr>
<tr><td colspan="2">එකතුව</td><td>100</td></tr>
</table>

**06. අයදුම් කිරීමේ ක්‍රමය :**

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.10.05** දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු යි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුර පිරවීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**07. සුදුසුකම් පිළිබඳ ලියවිලි :-**

(අ) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ :

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(iii) ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,
(iv) ක්ෂේත්‍ර සහායක තනතුරට පත් කරන ලද ලිපිය,
(v) ක්ෂේත්‍ර සහායක තනතුරේ ස්ථිර කරන ලද ලිපිය,
(vi) වෙනත් අදාළ සහතික.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම.**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව පත් කිරීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09.** මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදනය අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

**මහාචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්‍ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

2026 සැප්තැම්බර් මස 04 වැනි දින,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ
දෙපාර්තමේන්තුව.
තැ.පෙ. 556,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***පරිසර අමාත්‍යාංශය***

*වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ*
*ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්ෂේත්‍ර සහායක (අධීක්ෂණ) තනතුර සඳහා*
*පත් කිරීම - 2026*

01. 1.1 සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන් ) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

..........................................................................................................................................

(උදා : GUNAWARDANA H.M.S.K.)

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................................................................

..........................................................................................................................................

2.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................

2.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :..........................................................................

2.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

03. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.2 නිකුත් කළ දිනය : [ ]

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. 5.1 උපන් දිනය:

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

5.2 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

06. 6.1 ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ : [ ]

පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.2 ජනවර්ගය : ☐

සිංහල - 1
ලංකා දෙමළ - 2
ඉංදියානු දෙමළ - 3
මුස්ලිම් - 4
බර්ගර් - 5
වෙනත් - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. විවාහක / අවිවාහක / වැන්දඹු ද යන වග :

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |
| වැන්දඹු | |

08. 8.1. වර්තමාන සේවා ස්ථානයේ නම :.....................................................................................

8.2. ක්ෂේත්‍ර සහයක තනතුරට පත්වූ දිනය :.....................................................................................
8.3. ක්ෂේත්‍ර සහයක තනතුරේ ස්ථිර වූ දිනය :..............................................................................

8.4. ක්ෂේත්‍ර සහයක තනතුරේ සේවා කාලය :...............................................................................

09. ඔබ උසාවියකින් වරදකරුවකු වී තිබේද? : ..................................................................................
එසේ නම් හේතු දක්වන්න : .......................................................................................................

10. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ සාමාර්ථයන් :

| *වර්ෂය : ......................... විභාග අංකය : ...........................................* | |
|---|---|
| ***විෂයය*** | ***සාමාර්ථ්‍යය*** |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

11. අ.පො.ස. උසස් පෙළ විභාගයේ සාමාර්ථයන් :

| *වර්ෂය : ......................... විභාග අංකය : ...........................................* | |
|---|---|
| ***විෂයය*** | ***සාමාර්ථ්‍යය*** |
| | |
| | |
| | |
| | |

12. වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................................................................................
..........................................................................................................................................

13. වෘත්තීය සුදුසුකම් :..........................................................................................................................................
..........................................................................................................................................

14. අයදුම්කරුගේ ප්‍රකාශය / සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

...................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ................................
**දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු ය.**

01. පූර්වාසන්න වසර 05 තුළ මෙම නිලධාරියාට එරෙහිව විනය කටයුතු කිසිවක් කර ඇති ද / ඉදිරියේ දී කිරීමට අදහස් කරන්නේ ද යන්න? ඔව් / නැත

02. පිළිතුර **"ඔව්"** නම් ඒ පිළිබඳ ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේ ද? ..........................................................................................
..........................................................................................................................................

03. නිලධාරියා සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේ ද? ඔව් / නැත

04. පිළිතුර **"ඔව්"** නම් ලබාගත් වැටුප් රහිත නිවාඩු ගණන කොපමණ ද?

| *අනු. අංකය* | *නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසිය* | *කාල සීමාව* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| i. | ආයතන සංග්‍රහයේ < V:2:5:4 | | |
| ii. | ආයතන සංග්‍රහයේ< XII:16 | | |
| iii. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 10 | | |
| iv. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 33 | | |
| v. | ආයතන සංග්‍රහයේ<XII:36 | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | |

මෙම දෙපාර්තමේන්තුවේ ........................................................................................................ තනතුර දරන ..........................
..................................................මයාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ......................................

...................................................... ,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව.

09 - 46

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු දෙකක් (02) සම්පූර්ණ කිරීම සඳහා පහත 02 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **බඳවා ගැනීමේ ක්‍රමවේදය -**

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු, පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ තැනැත්තන් ලිඛිත පරීක්ෂණයකට හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පුරවනු ලැබේ.

**02.** **සුදුසුකම් -**

**I.** **අධ්‍යාපන සුදුසුකම්** - සංයුක්ත ගණිතය සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන් අතුරින් විෂයන් දෙකක් (02) ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**II.** **වෘත්තීය සුදුසුකම් -**

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**III.** **කායික සුදුසුකම් -** ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**IV.** **වෙනත් සුදුසුකම් -**

- අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම සුදුසුකම්, *ගැසට්* නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. වැටුප් පරිමාණය සහ කාණ්ඩය -**

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය : රු. 52,250-10×800-11×1190-10×1320-10×1350-100,040/-

**වැටුප් කේත අංකය** - MN3 – 2025

**04. වයස් සීමාව -**

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.10.05 දිනට හෝ ඊට පෙර හා 1996.10.05 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**05. සේවා කොන්දේසි -**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට බඳවා ගන්නා අයදුම්කරුවන් යටත් වනු ඇත.

II. මෙම තනතුරට පත්කරනු ලබන අය අවුරුදු තුනක (03ක) පරිවාස කාලයකට යටත් වනු ඇත.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03) ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු වේ.

IV. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු ය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික නීතිරීති වලට ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාවට හා ඊට සිදුකර ඇති හා සිදු කරනු ලබන සංශෝධනයන්හි කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කල ආණ්ඩුව නිකුත් කරන වෙනත් රෙගුලාසි වලට ද, මෙම පත්වීම යටත් ය.

**06. විභාග ක්‍රමය -**

I. මෙම විභාගය ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන අතර එම ආයතනයේ ප්‍රධානියා විසින් තීරණය කරනු ලබන දිනයක දී කොළඹ නගරයේ දී පමණක් විභාගය පවත්වනු ලැබේ.

II. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

III. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්නවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

**07. ලිඛිත පරීක්ෂණයේ දී විෂය නිර්දේශය -**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්නවලින් යුක්තය.<br>( කාලය පැය 01 - මුළු ලකුණු 100) |

<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂයය නිර්දේශය</th></tr>
<tr><td>2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය</td><td>
(1) ගොඩනැගිලි ඉදිකිරීම<br>
I. ගඩොල් බැම්ම හා කළුගල් බැම්ම<br>
(සංදි, මුලු, ආරුක්කු, තෙත් වැටි, ලින්ටල්ස්, ජේකඩ)<br>
II. බදාම මිශ්‍රණ වර්ග, කපරාරු සිමෙන්ති දැමීම, කොන්ක්‍රීට් මිශ්‍රණ<br>
III. නොයෙක් වර්ගවල සන්ධි කිරීම, පුලුක්කු කිරීම, තට්ටු ගැම, වැද්දීම, කුඩුම්බි කැපීම, යටලී මුට්ටු හා හේත්තු වැද්දීම<br>
IV. නොයෙකුත් වර්ගවල වහලවල් - (උලු,ඇස්බැස්ටස්, රළි තහඩු, ඇලුමිනියම් තහඩු, සිංහල උලු, පැතලි කොන්ක්‍රීට්)<br>
(2) තීන්ත ආලේප කිරීම<br>
I. නොයෙක් වර්ගවල ආලේප කිරීම්, බිත්ති ආලේප වර්ග, දැව ආලේප කිරීම, වාර්නිෂ් ආලේප කිරීම, මල නොබැඳෙන තීන්ත ආලේප කිරීම<br>
(3) පාරවල්<br>
I. බෝක්කු හා පැති බැම්වලට නූල් ගැසීම, ඒවා ඉදිකිරීම හා ඒ සඳහා යොදන ද්‍රව්‍ය පිළිබඳ දැනුම.<br>
II. මාර්ග සඳහා අත්තිවාරම් සකස් කිරීම, ගල් අතුරා තාර දැමීම, බොරලු දැමීම,මතුපිට ජල ප්‍රවාහනය<br>
(4) මූලික ජල සම්පාදනය හා ජල ප්‍රවාහනය<br>
I. කුඩා ප්‍රමාණයේ ගොඩනැගිලි සඳහා ජලනල, කසල නල යෙදීම, කසල වලවල් ඉදිකිරීම, ජල මුද්‍රිත උපකරණ, ජල ටැංකි හා ළිං ආදිය<br>
(5) විදුලි කාර්මික ශිල්පයට අදාළ ක්‍රියාවලියන්<br>
( කාලය පැය 03 - මුළු ලකුණු 100)
</td></tr>
</table>

**08. සම්මුඛ පරීක්ෂණය -**

ලිඛිත පරීක්ෂණයේදී එක් එක් විෂයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදුනොවන අතර, අයදුම්කරුවන්ගේ සහතිකපත්‍ර හා භෞතික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

**09. විභාග ගාස්තු -**

මේ සඳහා විභාග ගාස්තුව රු 500.00 ක් වන අතර, විභාග ගාස්තුව **"ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව"** නමින් බත්තරමුල්ල ලංකා බැංකු ශාඛාවේ ඇති ගිණුම් අංක **7042571** දරන ගිණුමට බැර වෙන පරිදි ඉල්ලුම් පත්‍රය භාරගන්නා අවසන් දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවීම් කර ලබාගත් ලදුපත තම ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත.

**10. අයදුම්පත් ඉදිරිපත් කිරීම -**

(අ) අයදුම්පත්‍රයේ අංක 01 සිට 04 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය අනෙකුත් පිටුවලටද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ

සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුවේ. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය *ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ආ*) මෙම නිවේදනයට යා කොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත **2026 ඔක්තෝබර් මස 05 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, "මිහිකත මැදුර", අංක 1200/06, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු ය.** මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ඇ*) ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්ය වේ.

(*ඈ*) අත්සන සහතික කිරීමට බලයලත් තැනැත්තකු විසින් අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු ලවා ද අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියකු යන අය අතරින් කවරෙකු හෝ ලවා සහතික කරවාගත යුතු ය.

**11. විභාගයට ඇතුළත් කර ගැනීම -**

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් ප්‍රවේශ පත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ www.landcom.gov.lk වෙබ් අඩවියෙහි දැන්වීමක් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් එම දැන්වීමෙහි සඳහන් ආකාරයට ඒ පිළිබඳව විමසීම කළ හැකිය. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් වෙතොත් ඔහුට/ ඇයට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතු වේ.

(*ආ*) විභාග අයදුම්කරුවන්ගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් පමණකි.

i. **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;**
ii. **වලංගු විදේශ ගමන් බලපත්‍රය.**

**12. විභාග ප්‍රතිඵල -**

මෙම නිවේදනයේ 07 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා ලද අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට විභාගය පවත්වනු ලබන ආයතන ප්‍රධානියා විසින් පියවර ගනු ඇත.

**13.** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

**14.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වනු ලබන ආයතනයේ ප්‍රධානියා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කලහොත් විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියාගේ තීරණය අවසන් තීරණය වේ.

**15.** අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**16.** මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීමේ / තීරණ ගැනීමේ අයිතිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සතුය.

**17.** මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර, කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැලපීමක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**චන්දන රණවීර ආරච්චි,**
ඉඩම් කොමසාරිස් ජනරාල්.

2026 අගෝස්තු මස 24 වැනි දින,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ අධිකාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2026

Open Competitive Examination for Recruitment to Grade III of the Post of Superintendent of Works in Supervisory Management Assistant Technological Service Category of Land Commissioner General`s Department -2026

[ ]
කාර්යාල ප්‍රයෝජනය සඳහා

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
( ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

සිංහල - 1
දෙමළ - 2 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම
 1.1 මුලකුරු සමඟ නම Mr./Mrs./Miss.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා - GUNATHILAKA B.M.I.S
 ..........................................................................................................................
 ..........................................................................................................................

1.2 සම්පූර්ණ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):-
.......................................................................................................................................................
...........................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්):-
.......................................................................................................................................................
...........................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. ලිපිනය:-

2.1 ස්ථිර ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්))
.......................................................................................................................................................
...........................................................................................................

2.2 ස්ථිර ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්)
.......................................................................................................................................................
...........................................................................................................

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.......................................................................................................................................................
...........................................................................................................

2.4 දුරකතන අංකය :- ජංගම ................................ ස්ථාවර ............................................

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (√ ලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

3.1 උපන් දිනය :-

| වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

3.2 අයදුම්පත් කැඳවන දිනට වයස :-

| වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

04. අයදුම්කරු අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය : - ...................................................................

4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:- ....................................................................................

4.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- ....................................................................................

05. අධ්‍යාපන සුදුසුකම් :-

5.1 අ.පො.ස.( සා/පෙළ) විභාගය විභාග අංකය :-........................... වර්ෂය :-...............

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 අ.පො.ස ( උ.පෙළ) විභාගය විභාග අංකය :....................... වර්ෂය :..................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

5.3 වෘත්තිය සුදුසුකම්:-

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

06. පරිගණක සාක්ෂරතාවය :-.................................................................................................

07. වෙනත් සුදුසුකම් :- ……………………………………………………………………………………..

08. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න, ඔව් නම් විස්තර පහත සඳහන් කරන්න)

.........................................................................................................................................

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර.

I. විභාග ගාස්තු ගෙවූ බැංකුව - ................................ ශාඛාව - .........................................

II. ගෙවූ දිනය - ............ ../............./......... ගෙවූ මුදල - .........................................

*විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන ලෙස අලවන්න.*

10. අයදුම්කරුගේ ප්‍රකාශය:

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි.මෙම අයදුම්පතේ යම් තොරතුරක් හෝ තොරතුරු කිහිපයක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වේ. තවද මේ සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවටද ප්‍රකාශ කරමි.විභාගයේ සියලුම කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි. විභාගය පවත්වන ආයතනයේ ප්‍රධානියා, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවට ද ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

දිනය ..........................

............................,
අයදුම්කරුගේ අත්සන.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:-

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී .................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය ..........................

..................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :- ...........................................................
තනතුර :-.............................................................
ලිපිනය :- ..........................................................
( නිල මුද්‍රාවකින් සනාථ කරන්න)

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත තොරතුරු සඳහන් ................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද, සහතික කරමි.

දිනය :-...............................

........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ නම :- ...........................................................
තනතුර :-.............................................................
ලිපිනය :- ..........................................................
( නිල මුද්‍රාවකින් සනාථ කරන්න)

## හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ තෙවන විභාගය - 2026

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(3) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම්ලත් අයදුම්කරුවන් හට 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(2) වගන්තිය යටතේ පැවැත්වීමට නියමිත තෙවන ලිඛිත විභාගය 2026 සැප්තැම්බර් මස 07, 08 සහ 09 යන දිනයන්වල සිරි ධම්මාරාමය, අංක 144, හයිලෙවල් පාර, නුගේගොඩ දී පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

ලේඛකාධිකාරී (වැ.බ.),
හෝමියෝපති වෛද්‍ය සභාව.

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

09 - 44

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
## (විවෘත පදනම මත බඳවා ගැනීම)

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්), III ශ්‍රේණිය
(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි), III ශ්‍රේණිය
(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමට 2026.08.07 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ 02. ඡේදයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026.09.18 ලෙස සංශෝධනය කරනු ලැබේ.

**ඉංජි. ඩබ්. ආර්. එන්. ආර්. ප්‍රේමචන්ද්‍ර,**
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

2026 සැප්තැම්බර් මස 04,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

09 - 48

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - (2026/2027)**

ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ (මෙහි මින් ඉදිරියට 'සේවය' යනුවෙන් සඳහන් වන) පවතින පුරප්පාඩු 25ක් පිරවීම සඳහා පහත අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 නොවැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications - Recruitment/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් භාර ගැනීම 2026 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 06 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ. දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

**01.** බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් මුළු ලකුණුවල එකතුව මත කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

**02.** අවශ්‍ය සුදුසුකම් :

I. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

II. කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයකුම මෙරට හෝ ලෝකයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

III. වෙනත්:

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. (ද්විත්ව පුරවැසිභාවය ඇති අය ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වුවහොත් ඔවුන් සිය විදේශ පුරවැසිභාවය අවලංගු කරවා ගත යුතු අතර සිය සේවා කාලය තුළ වෙනත් රටක පුරවැසිභාවය ලබා නොගත යුතුය.)

(*ආ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. (සෑම අයදුම්කරුවෙක්ම සම්මුඛ පරීක්ෂණයේදී තමන් සම්බන්ධයෙන් වන පොලිස් වාර්තාවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.)

(*ඇ*) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(*ඈ*) කුමන හෝ ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට ශ්‍රී ලංකා විදේශ සේවයට තෝරා ගැනීමේ විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නැත.

(*ඉ*) එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් අවස්ථා තුනක් පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටිය හැකිය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම සේවය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත, වසර 2016.12.06 දින ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක් කර ඇත්තා වූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වෙතොත් ඒවා ද සමග එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

II. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය

IV. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/ භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

VI. කිසියම් අපේක්ෂකයෙකු සේවයට බඳවා ගැනීමෙන් පසුව වුවද මෙම නිවේදනයේ හෝ ශ්‍රී ලංකා විදේශ සේවයේ ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් සුදුසුකමක් හෝ කොන්දේසියක් සපුරා නොමැති බවට හෝ සාවද්‍ය තොරතුරු සපයා ඇති බව තහවුරු වුවහොත් ඔහුගේ හෝ ඇයගේ සේවය අහෝසි කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**04. වයස් සීමාව:**

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට එළඹ සිටිය යුතු අතර අවුරුදු 28ට නොඑළඹ සිටිය යුතුය. (ඒ අනුව 2004.10.06 දිනට හෝ ඊට පෙර හා 1998.10.06 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු නම්, ඔහු/ ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඑළඹ සිටිය යුතු අතර, (ඒ අනුව 1991.10.06 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අය පමණක්) සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතු ය.

*සටහන:*

(i.) ඉහත 04 ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ 1 වෙනි පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

(ii.) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළදී හෝ සේවයේ යෙදී සිටි කාල සීමාව ඊට අඩු නම් එම මුළු කාල සීමාවේ දී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

(iii.) රාජ්‍ය සේවයේ නිලධාරියකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු/ ඇය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාල සීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු සේවා කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාල සීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

**05. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට අදාළව 2025.03.25 දිනැති අංක: 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ :

රු.82,150-10x2,400-8x2,940-17x3,900-රු.195,970 (SL-1-2025) - මාසිකව

06. ලිඛිත පරීක්ෂණය :

I. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

II. අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභාගයට පෙනී සිටිය හැක. එසේ වුව ද ඔහු /ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

III. ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *විෂයය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01. | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |
| 02. | ලෝක තතු I | පැය 03 | 100 | 40 |
| 03. | ලෝක තතු II | පැය 03 | 100 | 40 |
| 04. | රචනය | පැය 03 | 100 | 40 |
| 05. | සාරාංශය | විනාඩි 30 | 50 | 25 |
| 06. | බහුවරණ ප්‍රශ්න පත්‍රය<br>● බුද්ධි පරීක්ෂණය<br>● සාමාන්‍ය දැනීම සහ තත්කාලීන සිදුවීම | පැය 02 විනාඩි 30 | 150 | 75 |
| 07. | භාෂා ප්‍රවීණතා පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |

*සටහන:*

- සියලුම අයදුම්කරුවන් සඳහා පළමුව බහුවරණ ප්‍රශ්න පත්‍රය පමණක් පවත්වනු ලැබේ.
- බහුවරණ ප්‍රශ්න පත්‍රය සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් ඉතිරි විෂයයන්ට අදාළ විභාගය පවත්වනු ලැබේ.

IV. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

V. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටියකට අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*සටහන:*

(i) ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට, එක් එක් විෂයය සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය හා 300 කට නොඅඩු අවම මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත පරීක්ෂණ මණ්ඩලයක් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(iii) ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු ප්‍රමාණයට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණය එකතු කර කුසලතා අනු පිළිවෙළ සකස් කරනු ලැබේ. කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරකට බඳවා ගනු ලැබේ.

VI. ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය:

(*අ*) පොදු ප්‍රශ්න පත්‍රය:

ශ්‍රී ලංකාවේ දේශපාලන, සාමාජයීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳවත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන වත්මන් කරුණු පිළිබඳව සහ තාක්ෂණික හා විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳවත් අයදුම්කරු ලබා ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(*ආ*) ලෝක තතු I:

සමස්ත ලෝකයේ සාමය, ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා සහ ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා ලෝකයේ දේශපාලන සිදුවීම්, එක්සත් ජාතීන්ගේ සංවිධාන හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා ගැටුම් තත්ත්වයන් හා නොයෙකුත් ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාර වල දියුණුව අළලා වූ ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

(*ඇ*) ලෝක තතු II:

ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය, කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම, පරිසරය හා ධරණීය සංවර්ධනය වැනි ප්‍රශ්න හා ඒවා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය ඇතුළුව ආර්ථික සංවර්ධනයෙහි වර්තමාන ප්‍රවණතා පිළිබඳ ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වේ.

(*ඇ*) රචනය :

නියමිත විෂයයක් හෝ කිහිපයක් හෝ යටතේ රචනා ලිවිය යුතු ය. මෙම මාතෘකා අධ්‍යයන ක්ෂේත්‍රයේ කිසිම විෂයයකට සම්බන්ධ නොවන අතර, එය සකස් කරනු ලබන්නේ අපේක්ෂකයා/ අපේක්ෂිකාවගේ සාමාන්‍ය දැනීම සහ බුද්ධියත්, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවත් පරීක්ෂා කිරීම පිණිසය. මාතෘකාව යටතේ කරුණු දැක්වීමෙහිලා අයදුම්කරුගේ කල්පනා ශක්තිය හා ප්‍රතිභාව මෙන්ම භාෂා ශෛලිය හා ඉදිරිපත් කිරීමේ හැකියාව නිශ්චය කිරීම සඳහා රචනය උපයෝගී කර ගනු ලැබේ. එය කියවිය හැකි පරිදි පැහැදිලි අකුරෙන් ලිවිය යුතු ය

***සටහන :*** කරුණට අදාළවන පරිදි පැහැදිලිව ලිවීමේ වැදගත්කම කෙරෙහි අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විෂයය මනා පරීක්ෂණයකට භාජනය කිරීම, විමසා බැලීමේ ශක්තිය, ලිවීමේ තත්ත්වය, තම අදහස්

කෙටියෙන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තිය සඳහා ලකුණු හිමි වේ.

(ඉ) සාරාංශය:

දී ඇති ඡේදයක / ඡේදයන්හි අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇද ගන්නා ආකාරයෙන් පැහැදිලිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා කොටස් දෙකකින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(ඊ) බහුවරණ ප්‍රශ්න පත්‍රය :

මෙම ප්‍රශ්න පත්‍රය. එක් කොටසකට ලකුණු 75 ක් ලැබෙන ප්‍රශ්න 50 ක් බැගින් වූ පහත දැක්වෙන පරිදි වූ කොටස් දෙකකින් සමන්විත වනු ඇත.

- බුද්ධි පරීක්ෂණය : මෙම කොටසින් අයදුම්කරුවන්ගේ තාර්කික හැකියාව සහ විශ්ලේෂණාත්මක කුසලතාව මැන බැලෙනු ඇත. (කාලය : මිනිත්තු - 75)
- සාමාන්‍ය දැනීම හා තත්කාලීන සිදුවීම් : දේශීය හා ජාත්‍යන්තර වශයෙන් දේශපාලන, ආර්ථික සහ සමාජයීය - සංස්කෘතික ක්ෂේත්‍ර වල සිදුවන වෙනස්කම් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම කොටසින් මැන බැලෙනු ඇත. (කාලය : මිනිත්තු - 75)

(උ) භාෂා ප්‍රවීණතා ප්‍රශ්න පත්‍රය:

භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ලෙස ප්‍රශ්න පත්‍ර 03 ක් වන අතර මුළු ලකුණු ප්‍රමාණය 100ක් වේ. කාලය පැය 03කි.)

සිංහල මාධ්‍යයෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයන් ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයකට ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයන් සිංහල හෝ දෙමළ හෝ භාෂා ප්‍රශ්න පත්‍රයකට ද පෙනී සිටිය යුතුය.

**07 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:**

I. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට එක් එක් විෂයය සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් සහ ලේකම්වරයා විසින් නියම කරනු ලබන, 300 කට නොඅඩු මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා වූ අයදුම්කරුවන් පමණි. එතකුදු වුවත්, එසේ කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි විය යුතු ය.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100ක් හිමි වේ.

III. කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් යෝග්‍යතා - ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/ අපේක්ෂිකාව බඳවා ගනු ලබන සේවයට ඔහුගේ/ඇයගේ යෝග්‍යතාව මැන බැලීම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තම නිගමනයට එළඹීමේදී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ මානසික උත්සුකතාව, පෞරුෂත්වය හා මනා සන්නිවේදන හැකියාව කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අනෙකුත් භාෂා ප්‍රවීණතාවන් හා උසස් අධ්‍යාපන සුදුසුකම් මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඇගයීමට ලක් කරනු ඇත.

V. ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට දැන ගැනීමට සලස්වනු නොලැබේ.

VI. ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු ප්‍රමාණයට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණය එකතු කර කුසලතා අනුපිළිවෙළ සකස් කරනු ලැබේ. කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරකට බඳවාගනු ලැබේ.

VII. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ආකාරය පහත පරිදි වේ.

| | *යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය -ලකුණු ලබාදීමේ නිර්ණායක* | *කල්පිත ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපනික සුදුසුකම් :<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br><br>විශේෂ උපාධිය :<br><br>i. පළමු පන්තියේ සාමාර්ථයක් සහිත උපාධියක්<br>ii. දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක්<br>iii. දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සහිත උපාධියක්<br>සාමාන්‍ය උපාධිය :<br><br>i. පළමු පන්තියේ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක්<br>ii. දෙවන පන්තියේ ඉහළ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක්<br>iii. දෙවන පන්තියේ පහළ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක්<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | <br><br><br><br><br><br><br>20<br>18<br>16<br><br><br>18<br>16<br>14 | 20 |
| 02 | වෙනත්/ වෘත්තීය සුදුසුකම් :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br>i. පශ්චාත් උපාධියක් සඳහා<br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු)<br>iii. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06/ පැය 720 කට නොඅඩු)<br>iv. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03/ පැය 360 කට නොඅඩු)<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | <br><br><br><br>15<br>13<br>10<br><br>08 | 15 |
| 03 | ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාව :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br><br>i. ඉංග්‍රීසි විශේෂවේදී උපාධියක්<br>ii. ඉංග්‍රීසි භාෂාව උපාධියේ මුළු සම්භාරක අගයෙන් 1/3 ක් වන ප්‍රධාන විෂයයක් ලෙස (සාමාන්‍ය කලා උපාධිය යටතේ)<br>iii. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධියක්<br>iv. පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (කාල සීමාව වසරක් හෝ ඊට නොඅඩු විය යුතු ය.)<br><br>*හෝ*<br><br>TOEFL, (TOEFL-iBT Score 79, TOEFL-CBT Score 213, TOEFL-PBT, (Score 550 or above) IELTS (Score 6.0 or above) වැනි සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකමක්<br><br>v. ඉංග්‍රීසි භාෂාව අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස (දේශීය හෝ ලන්ඩන් විෂය නිර්දේශවලට අනුව) | <br><br><br>15<br>08<br><br>07<br>07 | 15 |

| යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය -ලකුණු ලබාදීමේ නිර්ණායක | | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | විශිෂ්ට සාමාර්ථයක්<br>අධිසම්මාන සාමාර්ථයක්<br>සම්මාන සාමාර්ථයක්<br>සාමාන්‍ය සාමාර්ථයක්<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 05<br>04<br>03<br>02 | |
| 04 | **විදේශ භාෂා ප්‍රවීණතාව:**<br>අරාබි, චීන (මැන්ඩරින්), ප්‍රංශ, ජර්මන්, හින්දි, ඉතාලි, ජපන්, කොරියානු, රුසියානු හා ස්පාඤ්ඤ යන භාෂා | | 10 |
| | (i.) විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය හදාරා තිබිය යුතුය) | 10 | |
| | (ii.) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ<br>විශිෂ්ට සාමාර්ථයක්<br>අධිසම්මාන සාමාර්ථයක්<br>සම්මාන සාමාර්ථයක්<br>සාමාන්‍ය සාමාර්ථයක් | <br>09<br>08<br>07<br>06 | |
| | (iii.) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ<br>විශිෂ්ට සාමාර්ථයක්<br>අධිසම්මාන සාමාර්ථයක්<br>සම්මාන සාමාර්ථයක්<br>සාමාන්‍ය සාමාර්ථයක් | <br>05<br>04<br>03<br>02 | |
| | (iv.) රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06/පැය 720 කට නොඅඩු) | 05 | |
| | (v.) රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ඩිප්ලෝමා / සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03/ පැය 360 කට නොඅඩු)<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 03 | |
| 05 | **පරිගණක ප්‍රවීණතාව :** | | 05 |
| | (i.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් | 05 | |
| | (ii.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (අවුරුද්දකට නොඅඩු) | 03 | |
| | (iii.) රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 06 කට නොඅඩු / පැය 720 කට නොඅඩු) (තොරතුරු තාක්ෂණ උපාධිය මූලික සුදුසුකම වන්නේ නම්, මෙම ශීර්ෂය යටතේ තොරතුරු තාක්ෂණ උපාධියට ලකුණු ලබා දෙනු නොලැබේ.) | 02 | |
| 06 | **රාජ්‍ය භාෂා ප්‍රවීණතාව (විභාගයට පෙනී සිටින භාෂාව හැර) :** | | 10 |
| | i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ පළමු භාෂාව ලෙස<br>විශිෂ්ට සාමාර්ථයක්<br>අධිසම්මාන සාමාර්ථයක්<br>සම්මාන සාමාර්ථයක්<br>සාමාන්‍ය සාමාර්ථයක් | <br>06<br>04<br>03<br>02 | |

| | *යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය -ලකුණු ලබාදීමේ නිර්ණායක* | *කල්පිත ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | ii. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවන භාෂාව ලෙස<br>විශිෂ්ට සාමාර්ථ්‍යයක්<br>අධිසම්මාන සාමාර්ථ්‍යයක්<br>සම්මාන සාමාර්ථ්‍යයක්<br>මාන්‍ය සාමාර්ථ්‍යයක් | <br>04<br>03<br>02<br>01 | |
| 07. | පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා:<br>පෞරුෂත්වය<br>සන්නිවේදන කුසලතා<br>සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | <br>10<br>10<br>05 | |
| | **එකතුව** | | **100** |

*සටහන:*

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්‍රවල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතික පත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාල සීමාව තහවුරු නොකළ සහතික පත්‍ර සඳහා ලකුණු ලබාදීම සඳහා සලකා බලනු නොලැබේ.

**08. අයදුම් කරන ආකාරය:**

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත් පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09. විභාගයට ප්‍රවේශය:**

I. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

II. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ තනතුර සඳහා සුදුසු යැයි පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

III. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

IV. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දී ය. සෑම අපේක්ෂකයකු/අපේක්ෂිකාවකම විභාගයට පෙනී සිටින පළමු දිනයේ දී ම විභාගයට පෙනී සිටීමට පෙර, තම ප්‍රවේශ පත්‍රය, විභාග ශාලාධිපතිට භාර දිය යුතු ය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට් පත්‍රයේ* පළ වේ.

10. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon)

(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

***සටහන:-***

(*අ*). ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*). ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*). විභාග සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**11. අයදුම්කරුගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(i.) ජාතික හැඳුනුම්පත

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණ කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12. ප්‍රතිඵල නිකුත් කිරීම :**

මෙම නිවේදනයේ 06 ඡේදයට අනුව උපරිම සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණයට යොමු කිරීමෙන් අනතුරුව එම පරීක්ෂණ දෙකෙන්ම ලබාගන්නා මුළු ලකුණු කුසලතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන

සංඛ්‍යාවක් ඇතුළත් කර සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබාදෙනු ඇත. අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**13. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයා විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති රීතිවලට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

16. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

17. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පරිදි පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඊට පසු දිනයක් වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**අරුණි රණරාජ,**
ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා
සහ සංචාරක අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 04 වැනි දින,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

09 - 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.